ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 21/ News/ 2012

# ළමා ප්‍රදීපය

ක්‍රි. ව. 2012 මැයි 28 සඳුදා
04 වෙළුම - 31 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00



# මරියතුමිය එලිසබෙත්තුමිය බැහැදැකීම

චිත්‍රය: නාමල් ද සිල්වා

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - **2695984 / 4899611**
ෆැක්ස් : 2692586 - ඊ-මේල් **pradeepaya@yahoo.com**
වෙබ් අඩවිය - **www.colombocatholicpress.lk**

# ගොවිතැනින් දෙවිඳුන්ට ප්‍රසන්න වූ ශා. ඉසිදෝරු මුනිතුමා.

**ආදරණීය දුවේ පුතේ...**

ගොවිතැනින් දෙවිඳුන්ට ප්‍රසන්නව ජීවත් වෙමින්, අන් අයට බැහැපත් කමින් සේවය කොට වරප්‍රසාද ආයාද කර ගත් ශාන්ත ඉසිදෝරු මුනිතුමා නගුලට පෙම්බැඳිව තම ශ්‍රමය වෙහෙසා ගොවිතැන් කටයුතු මගින් තම ජීවිකාව කරගනු ලබන කිතුනු බැතිමතුන්ගේ මහත් භක්ති ආදරයට පත්ව තිබෙනවා. එතුමන් වර්ෂ 1110 ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් නුවර ආසන්නයේ වූ කුඩා පැල්පතක මෙලොව එළිය දුටුවා. ඉතාමත් දිළිඳු වුවත් භක්තිමත් කිතුනු දෙමව්පියන් යුවළකට දාව උපන් මේ දරුවා හට ස්පාඤ්ඤ රාජ්‍යයේ නාමසාන්තුවරයා ලෙස සැළකෙන ශා ඉසිදෝරු නාමය අනුවම ඉසිදෝරු නමින් බව්තිස්ම කරනු ලැබුවා. මේ පුංචි ඉසිදෝරු දරුවා හට විධිමත් අධ්‍යාපනයක් ලබා දීමට ඔහුගේ දෙමව්පියන්හට වත්කමක් නොතිබූ අතර කිතුනු විශ්වාසය අනුව බැහැපත්කමින් යුත් දැහැමි ජීවිතයක් ගොඩනගා ගැනීමට පුංචි ඉසිදෝරු හට මඟ පෙන්නුවා.

ආදර දුවේ පුතේ,

වැඩිවියට පත් ඉසිදෝරු මැඩ්රිඩ් නුවර ආසන්නයේ වූ ගොවිපළක කම්කරුවකු ලෙස සේවය කරන්නට වුනා. වෙහෙස මහන්සිව අවංක කමෙන් වැඩ කිරීම හේතුවෙන් තම ස්වාමිවරුන්ගේ සිත්දිනා ගැනීමට හැකිවූ අතර මේ හේතුවෙන් ම එතුමන් සමඟ සේවය කළ අන් සේවක යන්ගෙන් එල්ල වූ ඊර්ෂ්‍යාව හා එදිරිවාදිකම් මැඩපවත්වා ගනිමින් ඔවුන්ට සමාව දුන් අතර සියළු දෙනා සමඟ හිතවත්කම් ඇති කරගනු ලැබුවා. තම ස්වාමිවරුන්ට ඉතා අල්ප දෙයින් පවා බැගෑපත්ව සේවය කිරීම ඔහුගේ පුරුද්දක් වුනා. වරක් මැඩ්රිඩ් හි පදිංචි ජෝන්.ඩී.වර්ගස් නම් ස්වාමියා යටතේවූ වතුපිටිවල ගොවිතැන් කටයුතු සිදුකළ අතර ඔහුගේ සේවයේ කැපවීම හා අවංක කම නිසාම සුළු වශයෙන් තිබූ ගොවිපලේ විශාල වර්ධනයක් ඉතා කෙටි කාලයකින් අත්කර ගත හැකිවුනා. එමනිසා තම ස්වාමියා සිය සොහොයුරෙකුට මෙන් ඔහුට සලකන්න වුනා. කොපමණ වැඩ කටයුතු තිබුනත් මේ හැඩිදැඩි ඉසිදෝරු තරුණයා තමන් කුඩාකල පටන් හැඩහුරුවට පත් දේවස්ථාන සේවය හා යාච්ඤාව වැනි භක්ති අභ්‍යාසයන් නොකඩවා සිදුකළා. ගොවිපලේ රැකියාවට යෑමට මත්තෙන් දේව මෙහෙයට සහභාගිව පැමිණීමට අතපසු කළේ නැහැ.

ගොවිපලේ කටයුතු වලදී පවා යාච්ඤාවෙන් ගත කළ අතර ඇතැම් අවස්ථාවන්හි දෙවිඳුන්ට ඔහු කැප කළ කාලයට සරිලන සේ ඔහු සමඟ ගොවිපොළේ වැඩ සඳහා දේව දූතයන් උදව් කළ බව ජනප්‍රවාදයේ පවතිනවා. මේ අතර ඔහු මේරි ඩොරිබියා නම් ඉතාමත් කරුණාවන්ත කාන්තාවක සමඟ විවාහ වූ අතර ඔවුන්ට උපන් දරුවා අවාසනාවන්ත ලෙස බාලවියේදීම මරණයට පත් වීමෙන් පසු ඉතාමත් දුක්බර දිවිපෙවතක් ගත කළා. වර්ෂ 1175 දී එතුමාගේ ආදරණීය භාර්යාව වූ ඩොරිබියා මිය ගියා.

ආදර දුවේ පුතේ,

පසු කාලයේ එනම් වර්ෂ 1697 දී 12 වන ඉනසෙන්ට් ශුද්ධෝත්තම පියතුමන් විසින් ඇය ගත කළ දිවිපෙවෙත අනුව ශුද්ධවරියක ලෙස නම් කරනු ලැබුවා. දිළිඳුන් සමඟ ජීවත් වෙමින් තමන් ලද වැටුප පවා අන් අයට අනුකම්පා කොට ලබාදුන් ඉසිදෝරුතුමාගේ ජීවිතය දැහැමි බවින් පිරී තිබුනා. වයස් ගත වීමත් සමඟ මාරාන්තික අසනීපයක් මෙතුමා වෙත ලංවුනා. මරණය සඳහා බලවත් ලැදියාවකින් හා සොම්නසින් යුතුව සූදානම් වී අවසන් සක්‍රමේන්තුව දැඩි භක්තියකින් ලබාගත් මෙතුමා වර්ෂ 1170 මැයි මස 15 වන දින ස්වර්ගස්ථ වුනා.

එතුමාගේ මැදිහත් කමින් බොහෝ ප්‍රාතිහාර්යන් සිදු වු අතර නොදිරා තිබුනු එතුමන්ගේ දේහය වසර 40 කට පසු නැවතත් එයින් ගොඩගෙන සාන්ත ඇන්ඩෲ තුමන්ගේ දෙව්මැදුරේ තැන්පත් කොට තිබෙනවා. වර්ෂ 1619 දී 5 වන පාවුළු පාප්වහන්සේ විසින් ශාන්ත ඉසිදෝරු මුනිතුමා ශාන්තු වරුන්ගේ නාමයට ඇතුළත් කළ අතර 13 වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමන් විසින් වර්ෂ 1622 මාර්තු 12 වන දින ශාන්තුවරුන් ලෙස නම් කරනු ලැබුවා. ගොවියන්ගේ ආරක්ෂක නාම ශාන්තු වරයා ලෙස සැළකෙන මෙතුමන් වෙනුවෙන් කෘෂි කාර්මික ප්‍රදේශයක මධ්‍යස්ථානයක් වූ මැඩ්රිඩ්හි වර්ෂ 1910 දී දේවස්ථානයක් ඉදිකර එතුමන් වෙත කැප කරනු ලැබුවා.

ආදර දුවේ පුතේ, ඔබත් මෙම සාන්තුවරයා පිළිබඳව තවත් කරුණු දැන ගත යුතුයි.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**



# ළමා ලෝකය

"මිනිස් ජීවිතය යනු සියලු සෘතුන්ගෙන් සමන්විත වර්ෂාවක් නම් එහි වසන්තය ළමා වියයි. ජීවිතය ප්‍රභාසම්පන්න දවසක් නම් හිරු කිරණින් ප්‍රමුදිත වූ පැහැසර අරුණෝදය ළමා වියයි. තිඹිරි ගෙයි සිට ජීවිතයේ කූටප්‍රාප්තිය සළකුණු කරන සුසානය දක්වා දිවෙන ගමන් මාර්ගය තුළ මිනිස් ජීවිතයේ අර්ථ කුළු ගැන්වෙන ප්‍රධානතම අවධියද ළමා වියයි.

දිගුවන් වු ජීවිතයේ සොඳුරුතම නිමේෂයන් කැටි වු ළමා විය පිළිබඳව ගොඩ නැගුණු උක්ත විවරණය කෙතරම් නම් චමත්කාරජනකද? අර්ථවත්ද ? නමුත් වර්තමාන ලාංකේය සමාජයේ සදාචාරය අත් වල මිට මොළවා පසෙකට විසී කරද්දී මෙබඳු විවරණයන් කෙතරම් දුරට වලංගුද යන්න ගැටලුවකි. හුදු මහත් සමාජයම සාවද්‍ය බව උපයුක්ත කොට ගනිමින් දෙනෙත් කඳුළැලි බොඳව යන සුව හසක් දරුවන්ගේ සෝ සුසුම් හිස් අහස් කුසට නලමුදු සුළං රොදක් නොව අඬන්නට ආසන්න වාලුකාවට දිය බිඳක් වන්නේ ය.



පසුගියදා හලාවත පදවි සංක්‍රමණික සේවා කොමිසම මගින් බණ්ඩිරිප්පුව මධ්‍ය මහා විද්‍යාලය හා දුම්මලකොටුව මධ්‍ය මහා විද්‍යාලය යන පාසල් හි පසු විපරම් වැඩසටහන් පැවැත්වුණි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.

**ටිරෝනි ප්‍රනාන්දු - (හලාවත සංක්‍රමණික සේවා කොමිසම)**

විසිරී ගිය පවුල් ජීවිතත්, මව්පිය අඬදබරත් මැද දිවි ගෙවන ළමා පරපුර අද අප සමාජයේ දිනෙන් දින පෘථුල වනු දැකීම නිරායාසයකි. සභ්‍යත්වය පිටු දැක පුහු ආටෝපයන්ගෙන් සැරසී දෙමාපියන් ගෙවන ජීවිතයේ අනිසි ඵල භුක්ති විඳින්නෝ නම් තුරු සිරසක උපන් හෙට දින විකසිත වන්නට පෙරුම් පුරන මල් කැකුළු වන් ළමා පරපුරයි. දරිද්‍රතාවයේ අන්ධකාරයෙන් ජීවිත බොඳව යන ශ්‍රී ලාංකේය සමාජයේ බොහෝ මව්වරු-න් පියවරුන්ගේ ප්‍රශ්න ගැටලු නිසා සුවහසක් බලාපොරොත්තු බොඳකර ළමා විය උගසට තියන දරුවන් අද රැකියා, පොළේ අප දසුනත යොමු වු වාර අනන්තයි. හුම්මානයෙ රළ පතර අතර සැඟව ගිය වර්තමාන ළමා මනස හුදු සතොසින් දිවි ගෙවනවා වෙනුවට දරා ගත නොහැකි සුවහසක් දුක් පීඩා මධ්‍යයේ ඉදිරි පියවර තබන්නට නොහැකිව අසරණව බලා හිඳින්නෝය.

මුළු ලොවම තනි යායක් බවට පත් වෙමින් විසල් ලොව අල්ප වු ගම්මානයක් බවට පත්ව ඇති බවට අපි උදම් ගී ගයමු. නමුත් සදාචාරයේ ගුණදම් වේරම්භ සුළගේ පැටලී සුව හසක් ඈතට ගොස් ඇති බව පිළි ගැනීමටවත් අද අප සූදනම් නැත. කුණු කන්දල් සේසැදුම්ලත් වත්මන් සමාජයේ දෙනෙතට කඳුළැලි එක් කොට තෙරක් නොපෙනෙන අනාගතයදෙස බලන්නට නොතිත් ආශා වෙන් දෙපා ඔසවන අවිහිංසක ළමයා නිරායා සයෙන් නැවතත් මහ කතරේ තනි වන්නේ අද සමාජය දරුවාගේ අනාගත දොරටුව අහුරා ඇති හෙයිනි. විවිධ ආගම් වලින් ඔදතෙදව පැමිණි ලාංකේය සමාජ යේ ගුණ දම් ගැන උදම් ඇනුව ද තදනන්තරව අනෙක් පසට ඒ මුවින්ම කෙතරම් දෑ කෙළසනවා ද? මහත් සමාජය ම තරගකාරිත්වයෙන් ධනය පසුපස මුර බල්ලන් සේ දුවද්දී අසරණ වන ළමා මනස අඬන හැටි නොඇසෙන්නේ ලාභය නම් ඝන්ඨා නාදය සිව් කොණින් නද දෙන්නට පටන් ගෙන අවසන් බැවිනි.

තරගකාරි ලෝකයේ අධි පාරිභෝගික සමාජයේ බහුවිධ ආශාවන්ගෙන් හෙම්බත් වු පුද්ගලයන්ගේ ජීවිතයේ අකලංක සෙනෙහසේ ප්‍රතිමූර්තියක් වු මව් පදවියට නිගා කරමින් අවිහිංසක දරු-වන් සමාජයේ බිල්ලක් බවට පත් කරන වත්මන් සමාජය තුළ දරුවාගේ අනාගතය ගැන කවර නම් කතාද? පිය සෙනෙහස මව් සෙනෙහස කුමක් ද කියා තේරුම් බේරුම් කර ගැනීමට නොහැකිව සෙනෙහස ඉල්ලා යදින දරුවන් අද අනන්තයි. අප්‍රමාණයි.

**තරංගා ප්‍රභාෂිණී**
ලුර්දු දේව මාතා සිද්ධස්ථානය
නාත්තන්ඩිය